රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 34/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1989 ජූනි මස 04 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
රාජ්‍ය අමාත්‍ය කාර්යාලවල ලේකම්වරුන් වෙත.

## රාජ්‍ය ඇමතිවරුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ වැටුප් සහ දීමනා

රාජ්‍ය ඇමතිවරුන්ට සහ එම අමාත්‍ය කාර්යාලවල කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වැටුප් සහ දීමනා පහත සඳහන් පරිදි වේ.

1. රාජ්‍ය අමාත්‍යවරයා

   මසකට රු. 12,500/= ක වැටුපක් හා රු.1000/= ක සංග්‍රහ දීමනාවි. මීට අමතරව, කලින් ව්‍යාපෘති අමාත්‍යවරයෙකුට දෙනු ලැබූ නිල වාහන වැනි වෙනත් පහසුකම්.

2. රාජ්‍ය අමාත්‍යවරයෙකුගේ කාර්යාලයක, ලේකම්

   වාර්ෂික රු.96,000-8x6,000-144,000/= වන වැටුප් ක්‍රමය සහ කලින් ව්‍යාපෘති අමාත්‍යාංශයක ලේකම්වරයෙකුට දෙනු ලැබූ නිල වාහන හා වෙනත් පහසුකම්.

3. රාජ්‍ය අමාත්‍යවරයෙකුගේ කාර්යාලයක, පෞද්ගලික ලේකම්

   (අ) වැටුප: වාර්ෂික රු.33,000-10x900-42,000/=

   (ආ) දීමනා: මසකට රු.500/= ක පරිවර්තිත අතිකාල දීමනාවක් සහ මසකට රු.150/= ක සංග්‍රහ දීමනාවක්.

   (ඇ) නිල වාහන: නිල වාහනයක් හිමිය. වැඩිදුර උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

   (ඈ) පත්වීම: පත්වීම තාවකාලික වන අතර, රාජ්‍ය සේවයෙන් හෝ ඉන් බාහිරව හෝ පත්කළ හැකිය. පත්කරනු ලැබූ තැනැත්තා එම තනතුරෙහි යම්තාක් කල් සිටිය යුතු යයි අදාළ රාජ්‍ය ඇමතිවරයා නිශ්චය කරන්නේද, එසේ නිශ්චය කරනු ලබන කාලයකට එම තනතුර දැරීම සීමා වේ.

( 2 පිටුව

4. රාජ්‍ය අමාත්‍යවරයෙකුගේ කාර්යාලයක සම්බන්ධීකරණ නිලධාරී:

(අ) වැටුප: වාර්ෂික රු.33,000-10x900-42,000/=

(ආ) දීමනා: මසකට රු.250/= ක පරිවර්තිත අභිකාල දීමනාවක්. (නිල වාහනයක් හිමි නොවේ.)

(ඇ) පත්වීම: පත්වීම තාවකාලික වන අතර, රාජ්‍ය සේවයෙන් හෝ ඉන් බාහිරව හෝ පත් කළ හැකිය. පත්කරනු ලැබූ තැනැත්තා එම තනතුරෙහි යම්තාක් කල් සිටිය යුතු යයි අදාල රාජ්‍ය ඇමතිවරයා නිශ්චය කරන්නේද, එසේ නිශ්චය කරනු ලබන කාලයකට එම තනතුර දැරිම සීමාවේ.

(සිරිල් ගමගේ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.